## කොරෝනා වෛරසයෙන් මුළු මහත් ලෝක වාසී ජනතාව ගලවා ගැනීම උදෙසා කරනු ලබන විශේෂ යාච්ඤාවේ, උපවාසයේ හා දයාවේ දිනය - 2020 මැයි 14

# ගාලු රදගුරු පදවිය

2020 මැයි 03 වන දින අති උතුම් පළමු වන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන් විසින් කරනු ලැබූ විශේෂ ආරාධනය අනුව යමින් කොරෝනා වෛරසයෙන් මුළු මහත් ලෝක වාසී ජනතාව ගලවා ගැනීම උදෙසා සංවිධානය කර ඇති විශේෂ යාච්ඤාවේ, උපවාසයේ හා දයාවේ දිනය සඳහා සියලු ආගම්හි විශ්වාසයකයින්, යහපත් දයාකරුණාවෙන් පිරි මිනිසුන් වෙත අධ්‍යාත්මිකව ඒකාත්මික වන්නට අන්තර් ආගමික සංවාදය පිලිබඳ වූ ශුද්ධාසනීය කවුන්සිලයේ සභාපති කාදිනල් හිමිපාණන් විසින් ආරාධනා කරනු ලැබ ඇත.

ගාලු රදගුරු පදවියේ අති උතුම් දේවධර්මාචාර්ය රේමන් වික්‍රමසිංහ රදගුරු හිමිපාණන් වහන්සේගේ මග පෙන්වීම තුළ කොරෝනා වෛරසයෙන් මුළු මහත් ලෝක වාසී ජනතාව ගලවා ගැනීම උදෙසා කරනු ලබන ගාලු රදගුරු පදවි විශේෂ යාච්ඤාවේ, උපවාසයේ හා දයාවේ දිනය සඳහා ගාලු රදගුරු පදවියේ සියළුම පියවරුන්ට, පැවිදි සහෝදර සහෝදරියන්ට හා ගිහි ජනතාවට ගෞරවයෙන් ආරාධනා කර සිටිමි.

**1) <u>දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අභියස එක් හෝරාවක් තුළ කරනු ලබන විශේෂ යාච්ඤාව</u>**

| | |
|---|---|
| **උදෑසන 11 සිට දහවල් 12** | **දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වැඩමවීම හා විශේෂ යාච්ඤාවේ හෝරාව** |

උදෑසන 11 සිට දහවල් 12 දක්වා මීසම් භාර පියතුමා විසින් දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ දේවස්ථානය තුළ වැඩමවීම. දේවස්ථානය සමීපයේ පිහිටා තිබෙන කන්‍යාරාම වල ගරු පැවිදි සොහොයුරියන් දේවස්ථානයේ විශේෂ මෙහෙයට සහභාගී වනු ඇත. දේවස්ථානයට දුරින් පිහිටා තිබෙන කන්‍යාරාම වල ගරු පැවිදි සොහොයුරියන් තම කන්‍යාරාමයේ දෙව් මැදුර තුළ දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ වඩමවා කොරෝනා වෛරසයෙන් මුළු මහත් ලෝක වාසී ජනතාව ගලවා ගැනීම උදෙසා කරනු ලබන ගාලු රදගුරු පදවි විශේෂ යාච්ඤාවේ, උපවාසයේ හා දයාවේ දිනය සඳහා සහභාගි වේ. මීසම් භාර පියතුමා විසින් මීසම් වාසී ජනතාව නියෝජනය වන ලෙස කීප දෙනෙකුට ආරාධනා කළ හැකිය. එලෙසම රදගුරු පදවිය තුළ පිහිටා තිබෙන දයාවේ ආයතන වලට හා පැවිදි සංඝයන් ඔවුන්ගේ ස්ථානයන්හි සිට මෙම විශේෂ යාච්ඤාවේ හෝරාවට සම්බන්ධ වන මෙන් ඉතා කාරුණිකව ආරාධනා කර සිටිමි.

**2) <u>රදගුරු පදවියක් ලෙස ශුද්ධ වූ ජපමාලය තුළින් දෙව් මව් යැදීම</u>**

| | |
|---|---|
| **සවස 7 සිට 7.45 දක්වා** | **පදවියක් ලෙස ශුද්ධ වූ ජපමාලය උච්ඡාරණය කිරීම** |

රදගුරු හිමිපාණන් වහන්සේ, සියළුම පූජා ප්‍රසාදීවරුන්, සියළුම පැවිදි පියවරුන් හා සොයුරන් ඔවුනගේ සංඝයන් වල සිට, සියළුම පැවිදි සොයුරියන් ඔවුනගේ කන්‍යාරාම තුළ සිට සහ දේව ජනතාව පවුල් ලෙස ඔවුනගේ නිවස් තුළ සිට, ශුද්ධ වූ ජපමාලය උච්ඡාරණය කරමින් මුළු මහත් ශුද්ධ වූ කතෝලික සභාව සමඟ ඒකාත්මික වෙමින් කොරෝනා වෛරසයෙන් මුළු මහත් ලෝක වාසී ජනතාව ගලවා ගැනීම උදෙසා, ගාලු රදගුරු පදවියක් ලෙස දෙව් මව්න්ගේ මැදහත්කාරකම යැදීම උදෙසා එකට අත්වැල් බැඳ ගනු ඇත. (මීසම් භාර පියතුමන් විසින් මීසම් දහම් සේවා සභාවේ නායක නායිකාවන් මේ සම්බන්ධව දැනුවත් කරනු ඇත. එසේම ඔවුන් විසින් තම කොට්ඨාසයේ ජනතාව දැනුවත් කරනු ඇත/ එසේම මීසම් භාර පියතුමා දුරකතන කෙටි පණිවිඩ මගින් මීසම් දැනුවත් කරනු ලැබේ).

ජේසු පිහිටයි!

ඩේමියන් අර්සකුලරත්න පියතුමා
ගාලු පදවි අපෝස්තලික සම්බන්ධීකාරක
2020 මැයි 10 වන දින